සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சப்ரகமுவ மாகாண கல்வி திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

| | |
|---|---|
| අනාවරණ පරීක්ෂණය<br>கண்டுபிடிப்பு சோதனை<br>Diagnostic Test | පැය 02 යි<br>02 மணி நேரம்<br>02 Hours |
| සිංහල භාෂාව හා සාහිත්‍යය I, II<br>சிங்கள மொழி மற்றும் இலக்கியம் I, II<br>Sinhala Language and Literature I, II | 06 ශ්‍රේණිය<br>தரம் 06<br>Grade 06 |

I කොටස

**ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01). පන්සිය පනස් ජාතක පොත රචනා කළ යුගය වන්නේ,

1. කෝට්ටේ යුගය
2. දඹදෙණි යුගය
3. කුරුණෑගල යුගය
4. මහනුවර යුගය

02). ස්වර අක්ෂරයකින් ආරම්භ නොවන වචනයකි.

1. ඔංචිල්ලාව
2. ගින්දර
3. ඊතලය
4. ඕලු

03). නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනයකි.

1. ප්‍රාතිහාර්ය
2. පරීක්ෂනය
3. මෑනියෝ
4. අධිෂ්ටානය

04). ‘කාසිය’ යන වචනයේ යෙදී ඇති පිල්ලම් වන්නේ,

1. ඉස්පිල්ල, දිගු පාපිල්ල
2. ඇලපිල්ල, පාපිල්ල
3. ඇදපිල්ල, ඉස්පිල්ල
4. ඇලපිල්ල , ඉස්පිල්ල

05). හිස්තැනට සුදුසු උක්ත පදය වරහන තුළින් තෝරා ලියන්න.

- (ගායිකාවක /ගායිකාවක් )........................ සම්මාන ලැබුවාය.
- (ඔවුන් /ඔවුහු ) ................................ නේවාසිකාගාර තුළ රැඳී සිටිති.

06). හිස්තැනට සුදුසු අනුක්ත පදය වරහන තුළින් තෝරා ලියන්න.

- ඔහුගේ ගායනය (අප/අපි ) ....................... පිනවිය.
- මම (තොප/තොපි) ................................ හඳුනමි.

07). හිස්තැනට සුදුසු ක්‍රියා පදය වරහන තුළින් තෝරා ලියන්න.

- අම්මා ගී ගයමින් නංගී........................ (නැළෙව්වාය/නැළෙව්වේය).
- පෙදරේරුවෝ ගොඩනැගිලි ඉදි................(කරති /කරයි).

08). සුදුසු විරාම ලක්ෂණ යොදා මෙම වැකිය නැවත ලියන්න. අම්මේ අනික් පාර මමත් බෝට්ටුවෙන් යනවා යි සරත් කෑ ගැසුවේය

09). 'ඇඹුල්' යන පදයේ තේරුම වන්නේ,

1. බ්‍රාහ්මයන් 2. පොකුණ
3. සුදු මහනෙල් 4. උදේ ආහාර වේල

10). ස්ත්‍රී ලිංග ඒක වචන උක්ත නාම පදයට යටින් ඉරක් අඳින්න.

1. කාන්තාවක් 2. නිළියක
3. ගායිකාවන් 4. දැරියෝ

11). පහත සඳහන් පදවලට සමාන පද ලියන්න.

- අන්ධකාරය - ..................................................
- ප්‍රතිවාදීන් -..................................................

12). පහත සඳහන් පදවලට විරුද්ධ පද ලියන්න.

- ආගන්තුක - ..................................................
- විදේශික - ..................................................

➢ **පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා නැවත ලියන්න.**

13). මිනිස්සු පාරේ වැඩ කරති.

.........................................................................................

14). මම පුස්තකාලයට යමි.

.........................................................................................

➢ පහත සඳහන් වාක්‍යවල ඍජු අදහස ලියන්න.

15). 'කොළ අත්ත ද කටට මුන් සිතට නො වන්නේ යැ'

................................................................................................................

16). 'හති ලන කලැ මුදුනින් මහ කළු වලාකුළු නික්මෙයි'

................................................................................................................

➢ **පහත සඳහන් පදවල අර්ථය ප්‍රකාශ වන සේ වාක්‍ය නිර්මාණය කරන්න.**

17). වැරහැලි - ................................................................................................................

18). කෙනෙහිලිකම් - ................................................................................................................

➢ **පහත දී ඇති ප්‍රස්තාව පිරුළු සඳහා වඩාත් ගැළපෙන අදහස තෝරන්න.**

19). පනින රිළවුන්ට ඉණිමං බැන්දා වගේ.

I. කෙනෙකු යම් විපතක් කිරීමට සූදානම් වීම.

II. වැරදි දැක දැක ඒවාට අනුබල දීම.

III. ඉහළින් යන සතුන්ට ආධාරකයක් සැපයීම.

IV. තමන් කළ වැරැද්දකට තමන්ම දඬුවම් කර ගැනීම.

20). ඇම ගිල්ල මාළුවා වගෙයි.

I. කරදර අතරට තවත් කරදර එකතු වීම.

II. ගැළවීමට අපහසු ලෙස යමක සිරවීම.

III. සිදු වූ වැරැද්දට පිළියම් නැති වීම.

IV. ඇමක් භාවිත කර මසුන් අල්ලා ගැනීම.

(ලකුණු 40)

## II කොටස

➢ **1 හා 2 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 05 කට පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න .

1. ස්වාභාවික පරිසරය සුරකිමු
2. කොවිඩ් වසංගතයෙන් රට බේරා ගනිමු
3. මා කැමති ලේඛකයා
4. ගැල්කරුවෙකුගේ ජීවිතය
5. වැද්දන්ගේ ජීවන රටාව

(ලකුණු 20)

02. ජන කතාවලට අදාළව ඔබ විසින් සැකසූ පොත් පිංච ආශ්‍රයෙන් පිළිතුරු සපයන්න.

1. ඔබ එම පොත සැකසුවේ කුමන පාඩම ඇසුරෙන්ද?
2. එම පොත් පිංච සැකසීමේදී ගුරුතුමාගෙන් හෝ ගුරුතුමියගෙන් ඔබට ලැබුණු උපදෙස් 02ක් ලියන්න.
3. ඔබ පොතට ඇතුළත් කළ ජන කතා 02ක් ලියන්න.
4. පොත නිර්මාණය කිරීමේදී ඔබට ඇති වූ ගැටලු 02ක් ලියන්න.
5. මෙම ක්‍රියාකාරකමෙන් ඔබ ලද අත්දැකීම් 02ක් ලියන්න

(ලකුණු 2×5=10)

03. පහත දැක්වෙන අවස්ථා අතුරින් එක් අවස්ථාවක් තෝරා ගෙන පිළිතුරු සපයන්න .

සමස්ත ලංකා නර්තන තරගයෙන් ජය ලැබූ ඔබේ මිතුරකුට සුබ පතා, සුබ පැතුම් පතක් සකස් කරන්න.

**හෝ**

පාසලේ පැවැත්වූ නිවාසාන්තර ක්‍රීඩා උත්සවය ගැන විස්තර කරමින් වෙනත් පාසලකට අස් වී ගිය මිතුරකුට පෞද්ගලික ලිපියක් ලියන්න.

(ලකුණු 10)

04. පහත දැක්වෙන අවස්ථා සම්බන්ධය ඇසුරෙන් වගුව සම්පූර්ණ කරන්න.

1. "හා,හා ,මම එහෙමත් කරනවද?"
2. ''පොකුණට බටුවන් කන්ට ලැබෙන්නේ දැ''යි
3. ''අම්මාව එක්ක යන්නේ මම ය'' යි
4. ''අපට කුතුරුමුවන් ගෙඩි ටිකක් කඩා ගන්නට ඇත්නම්!"
5. ''කිමෙක්ද? දරුවනි, පැන් නො බොව් දැ"යි

| | පාඩමේ නම | කීවේ කවුද? | කීවේ කාටද? |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |

(ලකුණු 2×5=10)

05. ඡේදය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කලා වැවේ ය. මෙය කළුගල කපා සාදා ඇත.මේ වාන මෑත කාලයන්හි ප්‍රතිසංස්කරණයෙහි දී පවා එසේම තිබෙන්නට ඉඩ හැර ඇත. මෙය අඩි 216ක් පළල අඩි 170ක් දිගු එකකි. මෙය එකල නිර්මාණය කෙරුණු පුදුමාකාර නිර්මාණයකි. එකල සිටි ශිල්පියාගේ ඉවසිලිවන්තකමත් දක්ෂ බවත් මින් පිළිබිඹු කෙරේ. විසල් වැවක තවත් වැදගත් අංගයක් ලෙස 'රළපනාව' හඳුන්වා දිය හැකිය. මෙය දිය රැලි වැවේ ඇතුළු බිත්තියේ වැදීමෙන් හානි පැමිණීම වැළැක්වීම සඳහා යොදා ගෙන ඇත්තකි. දිය රැල්ලෙන් වැව් බැම්ම ආරක්ෂා වීම මෙම නිර්මාණය නිසා සිදුවේ. තුන්වන සියවසේ සිටම විශාල වැව්වල බිසෝ කොටුව භාවිතව තිබිණි. 'ජලය බස්සනවා' යන අර්ථය ''බිසෝ කොටුව" යන වචනයෙහි ඇත. මෙමඟින් ජලය පාලනය කළ හැකි වුවාක් මෙන්ම මුළුමනින්ම නවතා දැමීම ද කළ හැකි විය.

1. ලංකාවේ විශිෂ්ටතම වාන පිහිටා ඇත්තේ කුමන වැවේද?
2. මෙම වානෙහි දිග හා පළල කොපමණද ?
3. දිය රැල්ලෙන් වැව් බැම්ම ආරක්ෂා වීම සඳහා සකසා ඇති නිර්මාණය කුමක්ද?
4. ''බිසෝ කොටුව" යන වචනයෙහි අර්ථය කුමක්ද?
5. "බිසෝ කොටුව" මගින් සිදුවන කාර්යය කුමක්ද ?

(ලකුණු 2×5=10)

06. පහත දැක්වෙන කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

සසඳ සසඳ අපි හඳපානේ යනවා
මම්මල බඳට ගොන් බානක් දක්කනවා
..........................................................................
දත් කැකුළට අපි කුරුණෑගල් යනවා

1. මෙම කවි පන්තිය කුමන ජන කවි වර්ගයකට අයත්වේද?
2. කවියේ ඇති ක්‍රියාපද දෙකක් ලියන්න.
3. කරත්තකරුවා යන්නේ කුමන ප්‍රදේශයකටද?
4. මෙහි සඳහන් නාම පද 02 ක් ලියන්න.
5. ඉහත පද්‍යයේ තුන්වන පද්‍ය පාදය සම්පූර්ණ කරන්න.

(ලකුණු 2×5=10)